# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 2171635 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1260/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 02/08/2024<br>පැය 0540 | | |

# මාධ්‍ය නිවේදනය

**01. හිස මතට පොල් ගෙඩියක් වැටී දැරියක් මියයාම - මාවනැල්ල පොලිස් වසම.**

2024.08.01 වන දින උදෑසන කාලයේ මාවනැල්ල පොලිස් වසමේ මාවනැල්ල නගරය ආසන්නයේ පිහිටි පෙර පාසලක ඉගෙනුම ලැබූ දැරියක්ගේ හිස මතට පොල් ගෙඩියක් වැටී මාවනැල්ල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා මහනුවර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට මාවනැල්ල පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මියගිය දැරිය වයස අවුරුදු 03 ½ ක් වන මාවාන, මාවනැල්ල ප්‍රදේශයේ පදිංචි දැරියකි.**

මියගිය දැරිය පෙර පාසල් භූමියේ සිටියදී මෙම අනතුර සිදුව ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය මහනුවර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මාවනැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අනත්ර්ජාලය හරහා අපරාධ සිදුකිරීම සම්බන්ධයෙන් විදේශ ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට - ගාල්ල පොලිස් ස්ථානය.**

2024.08.01 වන දින දහවල් කාලයේදී ගාල්ල වරාය පොලිස් වසමේ උඩුගම පාර, ගාල්ල ලිපිනයේදී ගාල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත තාවකාලික ලැගුම්හලක් පරික්ෂා කර අන්තර්ජාලය හරහා අපරාධ සිදු කිරීම සම්බන්ධයෙන් විදේශ ජාතිකයින් 08 දෙනෙකු අත්අඩංගුවට ගෙන ගාල්ල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 24 හා 36 අතර වයස්වල පසුවන චීන ජාතිකයින් 06 දෙනෙකු, කසකස්ථාන ජාතිකයෙකු හා කිර්ගිස්ථාන ජාතිකයෙකු වේ.**

සැකකරුවන් සන්තකයේ තිබී පරිගණක යන්ත්‍ර 09 ක්, ජංගම දුරකතන 73 ක් හා සිම්පත් රාශියක් සොයා ගෙන ඇති අතර ගාල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - සෙට්ටිකුලම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුර.**

2024.08.01 වන දින අළුයම් කාලයේදී මැදවච්චිය පොලිස් වසමේ කනදරාව හන්දිය අසලදී සෙට්ටිකුලම පොලිස් විශේෂ කාර්ය බලකා කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරුක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 930 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන මැදවච්චිය පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26, 28 හා 36 වයස්වල පසුවන මැදවච්චිය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මැදවච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. පුරාවිද්‍යා වටිනාකමක් ඇති බවට පවසමින් රන් පැහැති නෙළුම් මලක් සන්තකයේ තබාගෙන අලෙවි කිරීම සඳහා සූදානම්ව සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට - මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.08.01 වන දින දහවල් කාලයේ මාතලේ පොලිස් වසමේ අළුවිහාරය ප්‍රදේශයේදී මාතලේ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර විවිධ ප්‍රමාණයේ පෙති 24 කින් යුත් ග්‍රෑම් 706 ක් බර රන් පැහැති නෙළුම් මලක් රුපියල් 50,00,000/=ක මුදලකට අලෙවි කිරීම සඳහා සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මාතලේ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන කවුඩුපැළැල්ල, මාතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හදිසි ගින්නක් - පස්සර පොලිස් වසම.**

2024.08.01 වන දින රාත්‍රී කාලයේ පස්සර පොලිස් වසමේ මිල්ලබැද්ද ප්‍රදේශයේ වන රක්ෂිතයක ගින්නක් හටගෙන ඇති බවට පස්සර පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිළධාරීන් හා ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩපවත්වා ඇත.

ගින්නෙන් ජීවිත හානි කිසිවක් නොමැති අතර ගින්නට හේතුව මෙතෙක් අනාවරණය වී නොමැත. පස්සර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - හොරණ පොලිස් වසම.**

2024.08.01 වන දින උදෑසන කාලයේ හොරණ පොලිස් වසමේ රත්නපුර පානදුර මාර්ගයේ බොරළුගොඩ ප්‍රදේශයේදී පානදුර සිට රත්නපුර දෙසට ධාවනය වූ කාර් රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගය අසල ඇති බොක්කුවක ගැටී අනතුරුව පෙරලී මාර්ගය අයිනේ නවතා තිබූ ත්‍රීරෝද රථයක හා එහි රියදුරුගේද, පදික පුද්ගලයෙකුගේද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා හා ත්‍රීරෝද රථයේ රියදුරු බරපතල තුවාල ලබා හොරණ රෝහලට ඇතුලත් කර ප්‍රථිකාර ලබමින් සිටියදී පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29 ක් වූ බුලත්සිංහල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හොරණ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - වාවකච්චේරිය පොලිස් වසම.

2024.08.01 වන දින රාත්‍රී කාලයේ වාවකච්චේරිය පොලිස් වසමේ යාපනය මහනුවර ප්‍රධාන මාර්ගයේ නුනාවිල් හන්දිය ආසන්නයේදී වාවකච්චේරිය දෙස සිට යාපනය දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගය අයිනේ ගමන් කල පදික කාන්තාවකගේ හා පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පදික පුද්ගලයා, පදික කාන්තාව හා යතුරුපැදිකරු තුවාල ලබා වාවකච්චේරිය රෝහලට ඇතුලත් කර තිදෙනාම වැඩිදුර ප්‍රතිකාර සඳහා යාපනය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පදික පුද්ගලයා මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ කයිතඩි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය යාපනය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වාවකච්චේරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**